Tertiary and Vocational Education Commission

# Research Cell

# නව යෞවනයින්ගේ වෘත්තීය ලැදියාවන් හා වැඩ ලෝකය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය

Research By:

VTA



## පර්යේෂණ කණ්ඩායම

එල්. ඒ. කිත්සිරි මයා

යූ. ඒ. තමරා ප්‍රියන්ති මිය

ජී. පී. ජී. එම්. දමයන්ති මිය

ඩබ්ලිව්. ඒ. යසරත්න මයා

ජේ. කේ. දිල්රුක්ෂි මිය

එම්. ජී. ධර්මසේන මයා

**පරිච්ඡේදය - 01 - අධ්‍යනය හැඳින්වීම**

**01.01 හැඳින්වීම :-**

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් අතර මෑත කාලීනව අවධානය යොමු වී ඇති මාතෘකා අතර සේවා වියුක්තිය යන්න ඉදිරියෙන්ම පවතී. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ සිටින පිරිසෙහි විරුකියාව විවිධ මට්ටම් වලට හා පුම්තිරිභාවයට අදාලව හඳුනාගත හැකිය.

අධ්‍යාපනය සඳහා වූ රජයේ වැය හුදෙක් සමාජ සුභසාධනය සඳහා වූ පරිභෝජන වැයක් ලෙස මුල් කාලීනව විවිධ අර්ථ ශාස්ත්‍රඥයින්ගේ හා ප්‍රජාවගේ අදහස වූහ.දැනුම පමණක් පෝෂණය වන නිපුනතා හා ආකල්ප සංවර්ධනයේ ලා යොමු නොවුනු නිසාම දැනුම කේන්ද්‍ර කරගත් මිනිසුන් පමණක් එකල අධ්‍යාපන ක්‍රමයේ අනිවාර්ය ප්‍රතිඵලය බවට පත් වී තිබීම මෙයට ආසන්නතම හේතුව විය. නමුත් සමාජ ක්‍රමයෙන් වෙනස් වන දැනුම මත පදනම් වන එකතු කළ මානව ගුනාංග සහිත පූර්ව තත්ව කළමණාකරණ මාවතකට යොමුවීමත් සමඟ අධ්‍යාපනය මඟින් නිමැවෙන විද්‍යාර්ථයා තුළ දියුණු කුසලතා හා සංවර්ධනය කරගත හැකි ආකල්ප සහිත හැකියාවන් වැඩ ලෝකය විසින් අපේක්ෂ කරන ලදි.

ඕනෑම ශ්‍රමිකයෙකු දැනුම, කුසලතා, නිපුණතා, ආකල්ප අද්දැකීම් හා පළපුරුද්ද යන අංගවලින් පෝෂණය වූ විට ඔහු මානව ප්‍රාග්ධනිතයෙකු බවට පත් වේ. එනම් නුපුහුණු ශ්‍රමිකයෙකු පුහුණු වීම තුළින් ලබන ගුණාත්මක අංශයේ දියුණුවක් ලෙස මානව ප්‍රාග්ධනය හඳුනාගැනීමයි.

මානව ප්‍රාග්ධනය වූ කලි රටක න්ෂ්පාදන ධාරිතාවය ඉහළට නැංවීමට අත්‍යවශ්‍ය වන සජීවී සාධකයකි. ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියක මෙහෙයුම් අවස්ථාවේ සිට තිරණ ගනු ලබන සංයුක්ත මට්ටම දක්වා වූ ධූරාවලි සබඳතාවයක් ගොඩනැංවීම මඟින් ආර්ථික සංදර්භය තුළ පවතින බොහෝ පුද්ගල හා ආයතනික සබඳතා අතර ඵලදායී පදනමක් ඇති කිරීමේලා මානව ප්‍රාග්ධනය දායක වනු ඇත.

එවන් වූ ඵලදායී මානව ප්‍රාග්ධන්තයින් විවිධ මට්ටමින් බිහිකිරීමේ මූලික කාර්යභාරය රටක අධ්‍යාපන ක්‍රියාවලියට පැවරෙන මූලික වගකීමකි.

එම නිසා නූතනයේ අධ්‍යාපනය සඳහා වන වැය අතීතයේ මෙන් පරිභෝජන වැයක් ලෙස නොව ආයෝජන වියදමක් ලෙස Vaizey යන ආර්ථික විද්‍යාඥයා විසින් පෙන්වා දි ඇත.නූතනයේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික කුශලතා අතර සංයුක්ත

සබඳතාවයක් සහිත ක්‍රියා කාරීත්වයක් සමාජය විසින් අපේක්ෂා කරයි.ඒ වනා හි ශාස්ත්‍රීය අධ්‍යාපනය මත පදනම් වූ වෘත්තිය හා කාර්මික අධ්‍යාපන ක්‍රියාවලියයි.

වර්තමානයේ පාසල විසින් ශාස්ත්‍රීය අධ්‍යාපනයද වෘත්තිය හා කාර්මික අධ්‍යාපනය මඟින් ප්‍රායෝගික කුසලතා ද සංවර්ධනය කරන අයුරින් අධ්‍යාපනය ආයතනික විශේෂිකරණයට ලක් වී ඇත.

නමුත් සිදුවිය යුත්තේ මෙම ආයතනික විභේදනය අවම කර පාසල් මට්ටමින්ද වෘත්තිය කුසලතා සඳහා ප්‍රාථමික වශයෙන් හෝ හුරුවක් හා පෙළඹුමක් ඇතිවන ආකාරයෙන් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාවට නැංවීමයි.

පාසල් පද්ධතිය හා වෘත්තිය හා කාර්මික අධ්‍යාපන ආයතන මඟින් වැඩ ලෝකය අපේක්ෂා කරන ජීව ගුණයේ පිළිඹිබුවක් ඇතිකිරීම තුළින් නුතන අධ්‍යාපනය වැඩ ලෝකය හා සමිප කරවීමට එමඟින් හැකියාව ලැබෙන බවට විශ්වාස කල හැකිය.

එවිට වර්තමාන යෞවන පරපුර මුහුණ දී ඇති උග්‍ර විරැකියාව අවම කිරිම සඳහා වූ ව්‍යුහාත්මක සංදර්භයක් රට තුළ ගොඩ නැගීම පහසු කාර්යයක් බවට පත්වේ.

මෙම පසුබිම ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ තුළ ඇතිකිරීමට අවශ්‍ය මූලික මඟපෙන්වීම විමර්ශනය කරනු වස් මෙම අධ්‍යයනය පාසල් නව යෞවනයනගේ වෘත්තිය අපේක්ෂාවන් කොතරම් දුරට වැඩ ලෝකය ඉල්ලා සිටින රැකියා වර්ග හා වෘත්තිය ක්ෂේත්‍ර සඳහා සමපාත වේ දැයි සොයා ඉැලීමට පර්යේෂකයා විසින් ගනු ලබන උත්සාහයක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

මෙම පරිච්ජේදය මඟින් අධ්‍යනයේ ගැටළුව හඳුන්වා දීම එහි පසු බිම හැඳින්වීම එහි වැදගත් කම හා අධ්‍යනයේ අරමුණු හඳුන්වා දීම සිදුකරනු ඇත.

## 01.02. අධ්‍යන ගැටළුව හැඳින්වීම :-

පාසල් නව යෞවනයන්ගේ වෘත්තිය අපේක්ෂාවන් සහ වැඩ ලෝකයේ නුතන වෘත්තිය ප්‍රවනතා අතර පවතින සබඳතාවය පරික්ෂාකර බැලීම මෙම අධ්‍යනයට පාදක වන ගැටළුව ලෙස හඳුන්වා දිය හැක.

ආර්ථිකය තුළ සිදුවන වර්ධනයත් සමඟ නිතැතින්ම රැකියා සොයන්නන්ට රැකියා ලැබේයැයි විශ්වාස කිරීම අර්ථවත් නොවේ. වර්තමානයේ වැඩ ලෝකය තුළ වර්ධනය වන රැකියා අවස්ථාවන් හඳුනාගනිමින් ඊට ගැලපෙන හැකියාවන් සහ කුසලතා සංවර්ධනය කරගත් තරමට විරැකියාවට විසඳුම් ලබා ගත හැකිවේ.

නූතන වැඩ ලෝකයේ රැකියා ක්ෂේත්‍රය රාජ්‍ය අංශයේ සිට පෞද්ගලික අංශය දක්වා ප්‍රසාරනය වීමක් සිදුවෙමින් පවතී.

තවද ආර්ථිකයේ ව්‍යුහය නිෂ්පාදන අංශයේ සිට සේවා අංශය දක්වා සංක්‍රමනය වීමක් දක්නට ලැබේ. ඒ අනුව පුළුල්වන සේවා අංශය සහිත කර්මාන්ත ආශ්‍රිතව වැඩි රැකියා අවස්ථා නිර්මාණය වීමක් ඉදිරියේදී අපේක්ෂා කළ හැකිය.

එසේ වෙනස්වන වැඩ ලෝකයේ උදවන අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට හැකි පරිදි මානව සම්පත් සවිබල නැංවීම අධ්‍යාපන හා වෘත්තිය පුහුණු ආයතන වල ප්‍රධාන කාර්යයක් බවට පත්විය යුතුය.

අධ්‍යායන ගැටළුව හඳුනා ගැනීමේදී ඊට ආසන්න හේතු සාධක වන කරුණු කිහිපයක් පහත දැක්වෙන පරිදි සලකා බැලිය හැකි වේ.

❖ විරැකියා අනුපාතය (ප්‍රතිශත වශයෙන්)

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| අවු. 15-24 | 15.10 | 27.20 | 19.80 |
| අවු. 25-29 | 5.20 | 18.10 | 9.70 |
| 30ට වැඩි | 1.20 | 2.30 | 1.60 |

මූලාශ්‍රය :- ( ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2010)

මේ අනුව වයස අවුරුදු 15 -24 අතර තරුණ පිරිස් තුල වැඩිම විරැකියා අනුපාතයක් වාර්තා වී ඇත. එය 2010 මුලදී 20% ක් වේ. වයස අවුරුදු 15 - 24 අතර පුරුෂ පක්ෂයේ විරැකියා 15% කි.

වයස අවුරුදු 15 -24 අතර ස්ත්‍රී පක්‍ෂයේ විරැකියාව 27% ක් වේ. සෑම වයස් කාණ්ඩයකම ලක්‍ෂණය නම් ස්ත්‍රී පක්ෂයේ විරැකියාව පුරුෂ පක්‍ෂයේ විරැකියාව මෙන් දෙගුණයක් වීමය.

මේ අනුව වයස් කාණ්ඩ අනුවත් , එහි ස්ත්‍රී පුරුෂ භාවය හෙවත් පුමිතිරිභාවය අනුවත් 2010 වර්ෂය වන විට සැලකිය යුතු විරැකියා තත්වයක් උද්ගතව ඇති බව පාහැදිලි වේ. එමඟින් පාසල් නව යෞවනයන්ගේ අවධියේ වෘත්තිය අපේක්ෂාව වැඩ ලෝකය හා නොගැලපීමේ තත්වයක් නිරූපනය වේ.

❖ අධ්‍යාපන සුදුසුකම් අනුව විරැකියාව (ප්‍රතිශත ලෙස)

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| සා.පෙළ දක්වා | 42.0 | 32.9 | 37.2 |
| සා.පෙළ සමත් | 27.6 | 18.1 | 22.6 |
| උසස් පෙළ හා ඉන් පහළ | 30.4 | 49.1 | 40.3 |
| එකතුව | 100 | 100 | 100 |

මූලාශ්‍රය :- (ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය -2010 ජන හා සංඛ්‍යා ලේඛන දෙපා.)

මේ අනුව ඉහළම විරැකියා අනුපාතයක් පවතින්නේ අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහල අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිස් තුළ බව පෙනේ. 2010 දි එය 40.3% කි.

ඔවුන් අතරින් පුරුෂ පක්ෂයේ විරැකියාව 30.4% ක් ද ස්ත්‍රී පක්ෂයේ විරැකියාව 49.1% ක්ද වේ.

ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිතව සිටින ස්ත්‍රී පක්ෂය තුළ පුරුෂ පක්ෂයට වඩා ඉහළ විරැකියා අනුපාතයක් පවතින බව පෙනේ.

එමඟින් ද නව යෞවනයන්ගේ වෘත්තිය අපේක්ෂා කෙරෙහි පාසල් බලපෑම හා වැඩ ලෝකය අතර පවතින නොගැලපීම් සහගත තත්වය නිරූපණය කරයි.

තවද ,

- ❖ 2005 වර්ෂයේ සිට TVEC ආයතනය විසින් වැඩ ලෝකයට හඳුන්වාදුන් NVQ සුදුසුකම පිළිබඳව සිසුන්ගේ ගුරුවරුන්ගේ දෙමාපියන්ගේ හා සේවා යෝජකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම.

- ❖ රටේ පවත්නා පිළිගත් වෘත්තිය පුහුණු ආයතන හා ඒවායේ පවතින පාඨමාලා පිළිබඳ සිසුන් හා ගුරුවරුන් සතු අවබෝධය ප්‍රමාණවත් නොවන බව.
- ❖ වෙනස්වන වැඩ ලෝකයේ උද්ගතවන රැකියා වර්ග හා රැකියා ක්ෂේත්‍ර ගැන සිසුන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොතිබීම.
- ❖ සිසුන් වැඩි පිරිසක් රාජ්‍ය අංශයේ රැකියා අපේක්ෂා කිරීමේ ප්‍රවනතාවයක් පැවතීම.
- ❖ සිසුන් වැඩි පිරිසක් සමාජයේ උසස්යැයි සම්මත වෘත්තීන් පමණක් ඉලක්ක කර ගැනීම යනාදි ප්‍රවනතාවයන් මත උක්ත ගැටළුව අරභයා අධ්‍යනයක් සිදුකිරීමට පදනම සැකසුනු බව මෙහිලා සඳහන් කළ යුතු වේ.

**01.03. අධ්‍යනයේ පසුබිම :-**

ඉහත දැක් වූ ගැටළුව හඳුනා ගැනීම සඳහා වූ පසුබිම් වන සාධක පිළිබඳ ලුහුඩින් සලකා බැලීමක් මෙහි දී සිදුවේ.

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුළ මෑත කාලීනව වසරකට අ.පො.ස. (සා.පෙළ) විභාගයට 300000ට ආසන්න පිරිසක් පෙනී සිටිති. ඉන් 50% ක් පමණ එම විභාගයෙන් අසමත් වීම මත අධ්‍යාපන ප්‍රවාහයෙන් ඉවත්වේ.

ඒ අනුව අ.පො.ස. (සා.පෙළ) සමත් 150000ක පිරිසට දෙවන හා තෙවන වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට ඉල්ලුම් කරන තවත් 90000 ක් පමණ දෙනා සමඟ 240000 ක් පමණ වසරකට අ.පො.ස. උ.පෙළ. විභාගයට පෙනී සිටිති.

ඉන් 167000 ක් පමණ පිරිසක් උ.පෙළ විභාගය සමත් වන අතර විශ්ව විද්‍යාල පද්ධතියට ඉල්ලුම් කිරීම සඳහා ඉන් 45000 ක් පමණ සුදුසුකම් ලබති. ඉන්

විශ්ව විද්‍යාල වල විවිධ පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ 22000 ක් පමණ අයදුම්කරුවන් පිරිසකි. ඉන් 15000 ක් පමණ පිරිසක් කලා හා වාණිජ විද්‍යාපීඨ වලට ඇතුළත් කර ගනී. වෛද්‍ය, ඉංජිනේරු, නීතිඥ වැනි වෘත්තිය නැඹුරු උපාධි පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ අයදුම් කරුවන් 7000 ක් පමණි.

(දුරකථන සාකච්ඡාව - විභාග කොමසාරිස් ජනරාල් අනුර එදිරිසිංහ මයා - 2011.08.20 දින ඇසුරිනි.)

මේ අනුව ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක පාසල් හා විශ්ව විද්‍යාල පද්ධති අතර යෙදවුම් නිමවුම් සබඳතාවය ඵලදායි නොවීම පිලිබඳ අදහසක් ලබා ගත හැකිය. එක් අතකින් විශ්ව විද්‍යාල වලට බඳවා ගන්නා සිසුන් ප්‍රමානාත්මකව වැඩි කරමින් කලා හා සමාජ විද්‍යා පාඨමාලාවල සිට වෘත්තියාභිමුඛ උපාධි පාඨමාලා දක්වා පාඨමාලා විවිධාංගී කරනයක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාලව සිදු විය යුතුය.

නැතිනම් පාසල් අධ්‍යාපනයෙන් වාර්ෂිකව ඈඳහැලෙන අ.පො.ස. සා.පෙළ සිසුන් 150000 ක් හා අ.පො.ස.උ.පෙළ.විභාගයෙන් අසමත් වන විශ්ව විද්‍යාල වරම් අහිමිවීම මත ඉවත් වන 125000 ක් වශයෙන් 275000 ක පිරිසකට වෘත්තිය පුහුණුවක් ලබාගත හැකි විකල්ප පාඨමාලා හා පුහුණු ආයතන හඳුන්වා දීමේ ක්‍රියා මාර්ගයක් වෙත අපගේ අධ්‍යාපන ක්‍රමය ප්‍රති ව්‍යුහ ගතවීමේ අවශ්‍යතාවය මෙමඟින් නිරූපනය කරයි.

එම නිසා නූතනයේ නව යොවුන් විය පාසල් සිසුන්ගේ වෘත්තිය අපේක්ෂාවන් වැඩ ලෝකය හා ගැලපීමේ අවශ්‍යතාවය සහිත පසුබිමක් නිර්මාණය වී ඇති බව පෙනේ.

2009 වර්ෂය අගභාවයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය (ශ්‍රම බලකාය) මිලියන 8 විය. ඉන් 65% ක් පුරුෂ පක්‍ෂය ලෙසද 35% ක් ස්ත්‍රී පක්ෂය ලෙසද වාර්තා විය.

එසේම ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය අතරින් 30% ක් පුරුෂයින් වූ අතර 70% ක් ස්ත්‍රීන් විය. මේ අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සහභාගිත්වතා අනුපාතය ස්ත්‍රී පක්‍ෂයට සාපේක්ෂව පුරුෂ පක්‍ෂය තුළ දෙගුණයක අගයක් ගෙන තිබෙනු පෙනේ.

මූලාශ්‍රය :- (ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ දත්ත ප්‍රකාශය 2009 ජන හා සංඛ්‍යා ලේඛන දෙපා.)

එම වාර්තා දක්වන පරිදිම සෑම වයස් කණ්ඩායමකම ශ්‍රම බල සහභාගිත්වතා අනුපාතය ස්ත්‍රී පක්‍ෂයට සාපේක්ෂව පුරුෂ පක්ෂය තුළ බෙහෙවින් වැඩි බව පෙන්වයි.

පුරුෂ පක්ෂයේ උපරිම ශ්‍රම බල සහභාගි.වතා අනුපාතය එනම් 96% ප්‍රමාණය වයස අවුරුදු (35-39) අතර විය. ස්ත්‍රී පක්ෂය තුළ උපරිම ශ්‍රම බල සහභාගිත්වතා අනුපාතය එනම් 49%ප්‍රමාණය වාර්තා වුයේ අවුරුදු (45-49) අතර වයස් කාණ්ඩයෙනි.

මේ අනුව පුමිතිරිභාවය අනුව වැඩ ලෝකයේ රැකියා අවස්ථා හඳුනා ගනිමින් පුරුෂ පක්ෂයට ඇති සේවා නියුක්ත අවස්ථා හා ක්ෂේත්‍ර පිළිබඳවත් ස්ත්‍රීන් සඳහා විවර වී ඇති රැකියා අවස්ථා හා වෘත්තිය ක්ෂේත්‍ර පිළිබඳවත් මඟ පෙන්වීම් ලබාදීමේ නිෂ්චිත අවශ්‍යතාවය මේ මඟින් ඉස්මතු වේ.

වෘත්තිය පුහුණුවක් නොලද පුද්ගලයින්ගේ විරැකියාව අධ්‍යාපන මට්ටම අනුව

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| අ.පො.ස සා.පෙළට අඩු | 68,270 | 49.8% | 55,145 | 41.9% | 123,414 | 46.0% |
| අ.පො.ස සා.පෙළ දක්වා | 35,486 | 25.9% | 29,063 | 22.2% | 64,549 | 24.0% |
| අ.පො.ස උ.පෙළ හා ඉන් ඉහළ | 33,248 | 24.3% | 47,263 | 35.9% | 80,511 | 30.0% |
| එකතුව | 137,003 | 100% | 131,471 | 100% | 268,474 | 100% |

මුලාශ්‍රය :- (ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ දත්ත ප්‍රකාශය 2010 ජන හා සංඛ්‍යා ලේඛන දෙපා.)

වෘත්තිය පුහුණුවක් නොමැතිව සිටින විරැකියා සංඛ්‍යාවෙන් 46%ක ප්‍රමාණයක් අ.පො.ස සා.පෙළ මට්ටමට වඩා අඩු අධ්‍යාපන මට්ටමක සිටින අය බව පැහැදිලිවේ. අසමතුන්ගේ සමත්කම් හඳුනාගනිමින් ඔවුන් වෘත්තිය අධ්‍යාපනයෙන් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය මේ අනුව කැපී පෙනේ. තවද, වෘත්තිය පුහුණුවක් නොමැති විරැකියාවෙන් අ.පො.ස උ.පෙළ හා ඉන් ඉහළ අධ්‍යාපනයක් ලද අය අතර ස්ත්‍රී පක්ෂයේ විරැකියාව ඉහළ මට්ටමක පවතින බව පෙනී යයි.

| විරැකියාව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| වෘත්තිය පුහුණුවක් සහිත | 61,029 | 30.8% | 91,265 | 41.0% | 152,294 | 36.2% |
| වෘත්තිය පුහුණුවක් රහිත | 137,003 | 69.2% | 131,471 | 59.0% | 268,474 | 63.8% |
| එකතුව | 198,033 | 100% | 222,735 | 100% | 420,768 | 100% |

මූලාශ්‍රය :- (ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ දත්ත ප්‍රකාශය 2010 ජන හා සංඛ්‍යා ලේඛන දෙපා.)

විරැකියාවෙන් පෙළෙන්නවුන්ගෙන් 36.2% ක් පමණ කුමන හෝ වෘත්තිය පුහුණුවක් ලත් අය වීම විශේෂත්වයකි. ඒ අතරින්ද 41.0% ක් ස්ත්‍රී පක්ෂය නියෝජනය කරයි.

තවද ශ්‍රී ලංකාවේ ඌණ රැකියා නියුක්තිය ස්ත්‍රී පුරුෂ භාවය අනුව පහත පරිදි පෙන්නුම් කළ හැකිය.

| අනුපාතය | ස්ත්‍රී පුරුෂභාවය | | ආර්ථික අංශය | | එකතුව |
|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | කෘෂිකාර්මික | කෘෂිකාර්මික නොවන | |
| ඌණ රැකියා නියුක්ති අනුපාතය | 3.4 | 5.4 | 6.7 | 2.9 | 4.1 |

මූලාශ්‍රය :-( ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ දත්ත ප්‍රකාශය - 2009 ජන හා සංඛ්‍යා ලේඛන දෙපා.)

පුරුෂ පක්ෂයට වඩා ස්ත්‍රී පක්ෂයේ ඌණ රැකියා නියුක්තිය ඉහළ අගයක පවතී. එය 5.4 කි. එසේම කෘෂි කාර්මික නොවන වෘත්තීන් හි නියුතු වුවන්ට වඩා කෘෂි කාර්මික අංශයේ රැකියා නියුතු වුවන් තුළ ඌණරැකියා නියුක්තිය ඉහල අගයක පවතී. රැකියා නියුක්තිකයන් තුළ පවතින අඩු පුහුණුව හෝ කුසලතාවය මෙන්ම ආර්ථික අංශයේ ඇති රැකියා වල පැවැත්ම ස්ථිර නොවීම මත ද ඌණ සේවා නියුක්ති තත්වයන් ඇතිවිය හැකිය.

මේ මඟින් පුද්ගලයින්ගේ ඌණ සේවා නියුක්තිය අවම කිරීම සඳහා ඔවුන්ට ප්‍රමාණවත් වෘත්තිය පුහුණු අවස්ථා ලබාදීමේ අවශ්‍යතාවය පෙනී යයි.

තවද නූතන වැඩ ලෝකය ගතික මෙන්ම සංකීර්ණ ස්වාභාවයකින් යුක්ත වේ. එම නිසාම අනාගත සේවා නියුක්තකයින්ගේ ජිවන කුසලතා විශ්ව නැඹුරුවක් ගෙන තිබේ.

එමෙන්ම නූතන වැඩ ලෝකයේ ක්‍රියාත්මක වන කලමණාකරණ ප්‍රවේශය වන්නේ අසම්භාව්‍ය හෙවත් අවස්ථානුකූල ප්‍රවේශයයි. එමඟින් තමා මුහුණ දෙන අවස්ථාවට අනුව ගැටළු විසදීම්ලා හොඳම මිනිසුන්, තාක්ෂණ උපකරණ හා ක්‍රම ශිල්ප භාවිතා කිරීමට පෙළඹීමක් ඇතිකර ඇත.

මේ නිසා වැඩ ලෝකය බහු කුසලතා සහිත සේවා නියුක්තයින් අපේක්ෂා කරයි. සෑම දෙයක් ගැනම ප්‍රමාණවත් අවබෝධයක් අදාල වෘත්තිකයා තුළ අන්තර්ගතව පැවතීම මෙයින් ගම්‍ය වේ. ආයතනයට ලැදියාවීම යහපත් මානව සබඳතා ගොඩනංවා ගැනීම, විනයගරුක බව, ආවුධ උපකරණ සුරැකීම හා නඩත්තුව, කාළ කළමණාකරණය, ක්‍රමවත් බව, කැපවීම, නම්‍යශීලි බව, ආරක්‍ෂාව, නිර්මාණශීලීත්වය යනාදි ජීවන කුසලතා වැඩ ලෝකය අපේක්ෂා කරන බැවින් නූතන පාසල් නව යෞවනයන් තුළ එම කුසලතා මූලික වශයෙන් ගොඩනැංවීමේ අවශ්‍යතාවය වහා ආරම්භ කළ යුතුව ඇත.

ඒ සඳහා මඟපෙන්වීම් සැපයීම පිණිස පාසල් ගුරුවරුන් හා පාසල් වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන අංශ සතුව විශාල වගකීමක්ද පවතී.

එසේම නූතන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක අ.පො.ස. උ.පෙළ විභාගයට තෝරා ගැනීම සඳහා විෂයන් 64 ඇත.මේ තුළ උ.පෙළ සිසුන් අනවශ්‍ය ලෙස අතරමංවීමකට ලක්වේ.එය ගුණාත්මක ලෙෂ ඵලදායි වූ විෂය සංයුතියක් බවට පත් කිරීමේ අවශ්‍යතාවද මෙහිදී කැපී පෙනේ. මේ නයින් සලකා බලන විට පාසල් සිසුවාගේ සිට වැඩ ලෝකයේ සාර්ථක සේවා නියුක්තිකයෙකු වීම දක්වා වූ දිවෙන අඛණ්ඩ දාමයක් හඳුනා ගත හැකි අතර මෙම අධ්‍යනයෙන් අදාල පාර්ශවයන් සඳහා ප්‍රමාණවත් මඟපෙන්වීමක් සැපයීම පර්යේෂකයාගේ උත්සාහය වී ඇත.

**01.04. අධ්‍යනයේ තාර්කිකය ඃ-**

නූතනයේ පාසල් වෘත්තිය මාර්ගෝපදේශන ක්‍රියාවලිය ක්‍රියාත්මකව තිබියදීත්, සිසු වෘත්තිය අපේක්ෂණ හා වැඩ ලෝකය අතර නොගැලපීමක් පවතින්නේ ඇයි ද යන්න තේමා කර ගනිමින් මෙම අධ්‍යනය සිදුකර ඇත.

**01.05. අධ්‍යනයේ වැදගත්කම ඃ-**

ශ්‍රී ලංකාව තුළ උගත් තරුණ විරැකියාව සමාජ ගැටළුවක් බවට පත් වී තිබේ.ඉදිරියේදි එයට යම් ප්‍රමාණයක හෝ විසඳුම් ක්‍රියාමාර්ගයකට සමස්ථ ආර්ථික , සමාජ හා අධ්‍යාපනික පද්ධතිය පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය යොජනා හා උපාය මාර්ග සඳහා මඟපෙන්වීම් ලබා ගැනීමට මෙම අධ්‍යනයෙන් අපේක්ෂා කරන බැවින් පහත සඳහන් කරුණු නිසා එහි වැදගත් කම තහවුරුවන බව පෙන්වාදිය හැකිය.

01.05.01. සමකාලීන පාසල් නව යෞවනයන්ගේ වෘත්තිය අපේක්ෂා වල ස්වාභාවය හඳුනාගත හැකි වීම.

02. වර්තමාන පාසල් හා වෘත්තිය සහ කාර්මික අධ්‍යාපනයේ ක්‍රියාකාරීත්වය ඇගයීමට හැකිවීම.

03. වර්තමාන තරුණ පරපුර විවිධ අපේක්ෂා පෙරදැරිව සිය අනාගත වෘත්තිය පිළිබඳ තීරණ ගන්නා ආකාරය හඳුනාගත හැකි වීම.

04. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය අතර විධිමත් සහ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගත හැකිවීම.

05. වර්තමානයේ ක්‍රියාත්මක වන ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව පිළිබඳ සමස්ථ ප්‍රජාවේ අවබෝධය හඳුනා ගත හැකි වීම.

06. තෘතීක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ හඬු ක්‍රමය පිළිබඳ මැදිහත්වීම තවදුරටත් සවිබල ගැන්වීමේ ශක්‍යතාවයන් හඳුනාගත හැකිවීම.

07. පාසල්වෘත්තිය මාර්ගෝපදේශන සේවයක අවශ්‍යතාවය හඳුනාගැනීමත් තුළින් වැඩ ලෝකය පිළිබඳ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ අවබෝධය පුළුල් කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීමට අවධානය යොමුවීම. (වෘත්තිය තොරතුරු සාහිත්‍යයක් ඇතිකිරීමේ වැදගත් කම)

08. අනාගත වැඩ ලෝකයේ නූතන ප්‍රවනතා හඳුනා ගනිමින් සේවා යෝජකයින් හා පාසල් සහ වෘත්තිය ආයතන අතර ශක්තිමත් සබඳතාවක් ගොඩනංවා ගැනීමට මඟපෙන්වීම් ලබා ගත හැකි වීම.

**01.06. අධ්‍යනයේ අරමුණු :-**

01. නව යොවුන්විය පාසල් සිසුන්ගේ වෘත්තිය අපේක්ෂාවන් ගේ ස්වාභාවය රැකියා වර්ග හා වෘත්තිය ක්ෂේත්‍ර ආශ්‍රිතව හඳුනා ගැනීම.

02. වැඩ ලෝකයේ පවතින නූතන වෘත්තිය ප්‍රවනතා වල ස්වාභාවය රැකියා වර්ග හා වෘත්තිය ක්ෂේත්‍ර ආශ්‍රිතව හඳුනා ගැනීම.

03. ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) හා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වෘත්තිය පුහුණු ආයතන පිළිබඳව පාසල් සිසුන්ගේ ගුරුවරුන්ගේ හා සේවා යෝජකයින්ගේ අවබෝධය හඳුනා ගැනීම.

04. සිසු වෘත්තිය අපේක්ෂාවන් හා වැඩ ලෝකයේ පවතින වෘත්තිය ප්‍රවනතා අතර සබඳතාවය පරීක්ෂා කිරීම.

05. එම සබඳතාවය ශක්තිමත් කිරීම සඳහා පාසල් පද්ධතිය, වැඩ ලෝකය සහ වෘත්තිය ආයතන තුළින් ඉටු කළ හැකි බලපෑම පිළිබඳ සොයා බලා යෝජනා ඉදිරිපත් කිරීම.

**01.07. පද අර්ථ දැක්වීම :-**

- ❖ වෘත්තිය අපේක්ෂාවන් යනු විවිධ රැකියා වර්ග හා වෘත්තිය ක්ෂේත්‍ර පිළිබඳව සිසුන් තුළ ඇති අභිලාශයන් වේ.
- ❖ වෘත්තිය ප්‍රවනතා යනු රැකියා වර්ග හා වෘත්තිය ක්ෂේත්‍ර ආශ්‍රිතව සිදුවී ඇති වෙනස්වීම් වේ.
- ❖ වෘත්තිය ක්ෂේත්‍ර යනු රාජය, පෞද්ගලික, ස්වයංරැකියා ආදි අංශවේ.

- රැකියා වර්ග යනු එකිනෙක රැකියා තනතුරුය (වෛද්‍ය, ඉංජිනේරු, ගුරු ආදි)

- වැඩ ලෝකය යනු රැකියා වර්ග හා රැකියා ක්ෂේත්‍ර ඇතුළත් සමස්ථ ආයතන සංවිධාන හා කර්මාන්ත ඇතුළත් සංධර්භය වේ.

- වෘත්තීය ආයතන යනු වෘත්තීය හා කාර්මික පුහුණුව ලබාදීම අභිමුඛ කරගත් විවිධ ආයතනයන්ය.